"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE


204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011-2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011-2092601; ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / பொது தொலைபேசி / General Telephone } 011-2093000


මගේ අංකය. / எனது இல. / My No. } CSWP/ADM/18-38/FI/01-2019

ඔබේ අංකය. / உமது இல. / Your No. }

දිනය. / திகதி. / Date. } 2019-03-06

ආණ්ඩුකාර ලේකම්(බ.ප),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.),
සභා ලේකම්(බ.ප),
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්(බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන අභ්‍යන්තර විගණක (අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව-බ.ප.),
පරිපාලන නිලධාරි(පාලන),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2018, 24/2018, 31/2001(XIV), 27/2018 හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 02/2018 බස්නාහිර පළාතට අදාල කර ගැනීම.</u>**

රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/02/19/02/2019 හා 2019.02.13 දිනැති ලිපිය මඟින් මා වෙත දන්වා ඇත.(එම චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත.)

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2018, 2018-09-28 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරීන් දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2018, 2018-09-07 | වැටුප අර්ථ නිරූපණය කිරීම |
| 03. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 31/2001(XIV), 2018-12-14 | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය |
| 04. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/2018, 2018-12-31 | ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තිය සංශෝධනය කිරීම |

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 05. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 02/2018, 2018-11-28 | ක්ෂේත්‍ර නිලධර ගණයට අයත් රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ තනතුරු |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙසත් ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානින්, ආයතන ප්‍රධානින් හා නිලධාරින් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.එන්. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 21/2018

මගේ අංකය : ES/1/ චක්‍රලේඛ

රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ

නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

නිදහස් චතුරස්‍රය

කොළඹ 07.

2018.09.28

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 111 වන ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරීන් දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 බලාත්මක වන දින සිට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරීන් උක්ත චක්‍රලේඛයේ විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාවය ලබා ගත යුතු බැවින්, 2007.07.01 දින සිට 2012.05.15 දින දක්වා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධාරීන් ඔවුන්ගේ පත්වීම් ලිපියෙහි සඳහන් වන පළමු කාර්යක්ෂමතා කඩඉමට අයත් දෙවන භාෂා වාචික පරීක්ෂණය සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමට තීරණය කර ඇත.

02. දැනටමත් 2007.07.01 දිනට පසු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 111 ශ්‍රේණියට බඳවා ගන්නා ලද, පත්වීම් ලිපියෙහි සඳහන් වන දෙවන රාජ්‍ය භාෂා වාචික ප්‍රවීණතාවය නියමිත දිනට සම්පූර්ණ නොකිරීම හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිහි 111 වගන්තිය යටතේ පරිවාස කාලය දීර්ඝ කර පත්වීම ස්ථිර කරන ලද නිලධාරීන් වේ නම්, එම පරිවාස කාලය දීර්ඝ කිරීම සංශෝධනය කිරීම සඳහා අදාල ඉල්ලීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා මෙම අමාත්‍යාංශයට යොමු කිරීමට කටයුතු කළ යුතුය.

03. එසේම සේවා ව්‍යවස්ථාවේ අන්තර්කාලීන විධිවිධාන අනුව උසස් වීම් ලැබීමට සුදුසුකම් ලබන 2007.07.01 දිනට පසු සේවයට බඳවාගෙන ඇති නිලධාරීන්, පත්වීම් ලිපියේ සඳහන් විධිවිධාන අනුව <u>හෝ</u> රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා අනුෂාංගික චක්‍රලේඛයන්ට අදාල විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය, අදාළ උසස්වීම් ලබා ගැනීම සඳහා සම්පූර්ණ කර තිබිය යුතු වේ.

04. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව නිකුත් කරන ලදී.

පද්මසිරි ජයමාන්න

ලේකම්

රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ

නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 24/2018

මගේ අංකය : EST 5/4/24(XXVII)
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2018.09.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## වැටුප අර්ථ නිරූපණය කිරීම

රාජ්‍ය නිලධරයන් හා සම්බන්ධ විවිධ කාර්යයන්හි දී "වැටුප" යන පදය විවිධාකාරයෙන් අර්ථ ගන්වන බව නිරීක්ෂණය වී ඇත.

02. එබැවින් ආයතන සංග්‍රහයේ I වැනි පරිච්ඡේදයේ 1 වගන්තියේ අර්ථ නිරූපණ යටතේ සඳහන් "වැටුප" යටතේ සඳහන් වගන්තිය වෙනුවට පහත වගන්තිය ඇතුළත් කරමින් ආයතන සංග්‍රහය සංශෝධනය කිරීමට 2018.07.24 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

> **"වැටුප" යන්නෙන් අදහස් කෙරෙන්නේ වැටුප් පරිමාණයක් හෝ ස්ථාවර වැටුපක් යටතේ දැක්වෙන දීමනා රහිත වැටුප වන අතර වෙනත් නියමයක් කර නොමැති නම් ඊට කිසිදු දීමනාවක් ඇතුළත් නොවේ.**

03. ඒ අනුව ආයතන සංග්‍රහයේ "වැටුප" යනුවෙන් සඳහන් අනෙකුත් ස්ථානයන් ද සංශෝධනය විය යුතු ය.

04. මෙම චක්‍රලේඛය ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ද එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

P. J.
පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 31/2001(XIV)

මගේ අංකය: EST-3/DICIP/06/0270
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
අධිකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2018.12.14

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තියේ විධිවිධාන අනුව පහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලින් ප්‍රකාශිත විනය පරීක්ෂණ නිලධරයන්ගේ නාම ලේඛනයට මේ සමඟ ඇති 01 වන උප ලේඛනයෙහි දැක්වෙන විනය පරීක්ෂණ නිලධරයන්ගේ නම් අලුතින් ඇතුළත් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| අංක: 31/2001 | - 2001.12.03 | අංක: 31/2001(I) | - 2002.12.13 |
| අංක: 31/2001(II)-2004 | - 2004.10.13 | අංක: 31/2001(III)-2005 | - 2005.12.28 |
| අංක: 31/2001(IV) -2007 | - 2007.08.03 | අංක: 31/2001(V)-2008 | - 2008.10.31 |
| අංක: 31/2001(VI)-2010 | - 2010.10.08 | අංක: 31/2001(VII)-2011 | - 2011.10.12 |
| අංක: 31/2001(VIII)-2012 | - 2013.02.13 | අංක: 31/2001(IX)-2014 | - 2014.01.25 |
| අංක: 31/2001(X) | - 2015.02.12 | අංක: 31/2001(XI) | - 2016.02.29 |
| අංක: 31/2001(XII) | - 2017.02.22 | අංක: 31/2001(XIII) | - 2017.10.24 |

02. ඉහත චක්‍රලේඛ මගින් ප්‍රකාශිත නාම ලේඛනයන්හි සඳහන් විනය පරීක්ෂණ නිලධරයන් සම්බන්ධයෙන් කරන ලද සංශෝධන පිළිබඳ විස්තර 02 වන උප ලේඛනයේ දැක්වේ.

03. සේවයේ යෙදී සිටින නිලධරයන් ඔවුන්ගේ රාජකාරි කටයුතුවලට බාධා නොවන පරිදි විනය පරීක්ෂණ නිලධරයන් වශයෙන් පත්කර ගැනීමට අපහසු අවස්ථාවල දී ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:6 උප වගන්තියේ සඳහන් පරිදි මෙම උප ලේඛන 01හි සඳහන් විශ්‍රාමික නිලධරයන් ද ඉහත පළමුවන ඡේදයේ සඳහන් චක්‍රලේඛවල ඇතුළත් නිලධරයන්ට අමතරව 19:3 උප වගන්තියේ විධිවිධානවලට යටත්ව විනය පරීක්ෂණ විනිශ්චය සභා සඳහා පත්කළ හැකි ය.

04. ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:14 උප වගන්තියේ සඳහන් අවස්ථාවන්හි දී විනය පරීක්ෂණ නිලධරයන්ට රැකවරණ නිලධරයන් හෝ පැමිණිල්ල මෙහෙයවන නිලධරයන් හෝ වශයෙන් කටයුතු කළ නොහැක.

05. 1995.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 35/92(II) සහ 1997.11.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 35/92(IV) මඟින් නිකුත් කර ඇති විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනවල නම් සඳහන් නීතිඥවරුන්ට විනය පරීක්ෂණ නිලධරයන් වශයෙන් තවදුරටත් කටයුතු කළ හැකි ය.

06. විශ්‍රාම යාමෙන් පසුව 2001.10.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/2001(I) හි විධිවිධාන අනුව විනය පරීක්ෂණ නිලධර සංචිතයෙහි ලියාපදිංචිය අපේක්ෂා කරන නිලධරයන් විසින් 2017.10.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 31/2001(XIII)හි ඇමුණුම 01හි සඳහන් ආකෘතිය අනුව අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, ඒ අතුරින් සුදුසුකම් ලබන විශ්‍රාමික නිලධරයන්ගේ නාම ලේඛනය වරින්වර ප්‍රකාශයට පත් කරනු ඇත.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
අධිකරණ අමාත්‍යාංශය

උපලේඛන : 01

**ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තිය යටතේ වූ**

**විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය**

| අනු අංකය | මුලකුරු සමඟ නම | ලිපිනය හා දුරකථන අංකය | රාජ්‍ය සේවයේ අවසන් වරට දරන ලද තනතුර | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය | විනය පරීක්ෂණ පැවැත්විය හැකි දිස්ත්‍රික්ක | විනය පරීක්ෂණ පැවැත්විය හැකි මාධ්‍යය |
|---|---|---|---|---|---|---|
| 01. | ඩබ්ලිව්.පී. ගුණපාල මහතා | 96/7, මාකොළ දකුණ, මාකොළ. 071-4446007 | අතිරේක ලේකම් | ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව | ගම්පහ, කොළඹ, කළුතර, මහනුවර | සිංහල |
| 02. | පී.ඩී.ජේ. ද අල්විස් මහතා | අංක 53/2, මුල්ලේගම, අඹතැන්න, මහනුවර හරහා 077-3455166 081-2320420 | ප්‍රධාන ගණකාධිකාරී | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ | මහනුවර, අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල | සිංහල |
| 03. | ඩී.එම්.ජේ. දිසානායක මහතා | අංක 254 ඒ, ඒදඬුවාව පාර, පේරාදෙණිය 071-4487999 081-2085999 | පරිපාලන නිලධාරී | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | මහනුවර, මොණරාගල, බදුල්ල, නුවරඑළිය, හම්බන්තොට, කෑගල්ල, මාතලේ | සිංහල |
| 04. | ජේ.එල්. දොඩම්කොටුව මහතා | දොඩම්කොටුව, කොටලිගොඩ, මැණික්දිවෙල. 077-3869966 | ආණ්ඩුකාරවර ලේකම් (සබරගමුව පළාත් සභාව) | ආණ්ඩුකාරවර කාර්යාලය | මහනුවර, කුරුණෑගල, කෑගල්ල, රත්නපුර, අනුරාධපුර | සිංහල |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 05. | ජ්.ජේ.පී.කේ. බණ්ඩාර මහතා | 87/1/ඒ ,<br>ඉදිගොල්ල,<br>ගම්පහ.<br>077-4634814<br>033-2224697 | පරිපාලන නිලධාරී | අග්‍රාමාත්‍ය කාර්යාලය | සියලුම දිස්ත්‍රික්ක | සිංහල |
| 06. | පී. බාලසුබ්‍රමනියම් මහතා | YMCA,<br>ත්‍රිකුණාමලය.<br>077-5019602 | සහකාර විගණකාධිපති | විගණකාධිපති දෙපාර්තමේන්තුව | යාපනය,<br>මන්නාරම,<br>මුලතිව්,<br>කිලිනොච්චිය,<br>මඩකලපුව,<br>ත්‍රිකුණාමලය,<br>වවුනියාව | දෙමළ |
| 07. | ඩබ්ලිව්. ඩබ්ලිව්. රණවීර මහතා | අංක 17/1,<br>දෙවන පටුමග,<br>දර්ශණගම, ආණමඩුව.<br>071-3682540<br>032-2263635 | පරිපාලන නිලධාරී | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මහකුඹුක්කඩවල | පුත්තලම | සිංහල |

## රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලින් ප්‍රකාශිත විනය පරීක්ෂණ නිලධරයන් සම්බන්ධයෙන් කරන ලද සංශෝධන

සංශෝධන (කරන ලද සංශෝධනය * ලකුණින් සටහන් කර ඇත)

| අනු අංකය | චක්‍රලේඛ අංකය සහ අනු අංකය | නම | ලිපිනය හා දුරකථන අංකය | රාජ්‍ය සේවයේ අවසන් වරට දරන ලද තනතුර | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය | විනය පරීක්ෂණ පැවැත්විය හැකි දිස්ත්‍රික්ක | විනය පරීක්ෂණ පැවැත්විය හැකි මාධ්‍ය |
|---|---|---|---|---|---|---|---|
| 01. | 31/2001(XIII) – 2012<br>උප ලේඛන අංක: 02<br>අනු අංක: 01 | ඩී.ජී.කේ. කරුණාරත්න මහතා | XB/10/1/2,<br>එඩ්මන්ටන් රජයේ නිවාස,<br>කොළඹ 06.<br>*071-5489225<br>*077-0041119 | නියෝජ්‍ය කොමසාරිස් | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | කොළඹ,<br>රත්නපුර,<br>බදුල්ල,<br>ගාල්ල,<br>මාතර | සිංහල |
| 02. | 31/2001(IV) - 2007<br>උප ලේඛන අංක: 01<br>අනු අංක: 02 | බී.ජ්.ධනපාල මහතා | 685,<br>II වන පියවර,<br>වැව පාර,<br>අනුරාධපුර<br>025-2222915<br>*071-6003535<br>*077-8034204 | සහකාර ප්‍රාදේශීය ලේකම් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර | අනුරාධපුර,<br>පොළොන්නරුව,<br>කුරුණෑගල,<br>පුත්තලම,<br>*වවුනියාව,<br>*ත්‍රිකුණාමලය | සිංහල |
| 03. | 31/2001(VIII) - 2012<br>උප ලේඛන අංක: 02<br>අනු අංක: 11 | එල්. විජේසුන්දර මහතා | *ජාත්‍යන්තර බෞද්ධ කටයුතු අංශය, ශ්‍රී දළදා මාළිගාව,<br>මහනුවර.<br>081-2236202<br>071-4534369<br>077-9113210<br>විද්‍යුත් ලිපිනය : lionelwijesundara@ ymail.com | ශ්‍රී ලංකා විදේශ සේවය III | විදේශ කටයුතු අමාත්‍යාංශය | මහනුවර,<br>මාතලේ,<br>කුරුණෑගල,<br>කෑගල්ල,<br>පුත්තලම,<br>කොළඹ,<br>අනුරාධපුර,<br>කළුතර,<br>පොළොන්නරුව | සිංහල |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 04. | 31/2001(VIII) – 2012<br>උප ලේඛන අංක: 02<br>අනු අංක: 17 | ඒ. හිරිමුතුගොඩ මහතා | *222/4,<br>සොලමන් මාවත,<br>බෝකුන්දර,<br>පිළියන්දල<br>071-8099389<br>*071-9466092<br>*011-2709167 | ප්‍රාදේශීය තැපැල් අධිකාරී - පොළොන්නරුව | තැපැල් දෙපාර්තමේන්තුව | උතුරු නැගෙනහිර පළාත් හැර අනෙකුත් සියලුම දිස්ත්‍රික්ක | සිංහල |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 27/2018

මගේ අංකය : EST-6/03/LEA/3160
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2018.12.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තිය සංශෝධනය කිරීම

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එහි 16:2 හා 16:2:1 උප වගන්ති පහත පරිදි සංශෝධනය කිරීමටත්, 16:2:2 සිට 16:2:4 දක්වා නව උප වගන්ති ඇතුළත් කිරීමටත් 2018.08.28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

16:2 පිළිගත් ආයතනයක නිත්‍ය පාඨමාලාවක් හැදෑරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය මත පහත කොන්දේසිවලට යටත්ව රාජ්‍ය නිලධරයකුට වැටුප් රහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබා දිය හැකිය.

16:2:1 පරිවාසය පිට සිටින නිලධරයකුගේ පරිවාස කාලය විදේශ අධ්‍යයනයට ගත වන කාලයට සමාන කාලසීමාවකින් දීර්ඝ කිරීම.

16:2:2 අධ්‍යයනය ලබන නිලධරයාගේ කලත්‍රයා ද රාජ්‍ය සේවයේ නියුතු අයෙක් වන්නේ නම් කලත්‍රයාට මෙහි 16:1:9 හා 16:1:10 උප වගන්තීන්වලට යටත්ව වැටුප් රහිත නිවාඩු ලබා දීම.

16:2:3 මේ යටතේ අධ්‍යයන නිවාඩු ලබා ගන්නා නිලධරයකු මෙහි 16:15 උප වගන්තිය අනුව නියම වන අනිවාර්ය සේවා කාලයෙන් නිවාඩු නිර්දේශය ලබා දෙන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නියම කරනු ලබන කාලසීමාවක් එම දෙපාර්තමේන්තුව තුළම සේවය කර සම්පූර්ණ කළ යුතුය. එසේකුදු වුවත්, මෙම කොන්දේසිය රාජ්‍ය සේවයේම තවත් සේවාවක් සඳහා මුදා හැරීම වෙනුවෙන් කරනු ලබන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම සඳහා අදාළ කර නොගත යුතුය.

16:2:4 විදේශ අධ්‍යයන සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීමේ දී සඳහන් වන 16 වගන්තියේ අනෙකුත් කොන්දේසි සියල්ලක්ම 16:2 උප වගන්තිය යටතේ නිවාඩු දෙනු ලබන විට ද අදාළ වනු ඇත.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 02/2018

මගේ අංකය : EST 7/ALLOW/03/2014
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
අධිකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2018.11.28

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ක්ෂේත්‍ර නිලධර ගණයට අයත් රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ තනතුරු**

ක්ෂේත්‍ර රාජකාරිවල යොදවා ඇති, 2017.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 33/2017හි ඇමුණුම 01 හෝ 02 හි තනතුරු නාමය සඳහන් තනතුරුවල සේවය කරන සියලුම නිලධරයන්හට, 2014.03.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2014, 2014.06.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2014(I) සහ 2015.06.03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2014(II) හි විධිවිධාන ප්‍රකාර ක්ෂේත්‍ර දීමනාව සඳහා හිමිකම ඇත.

02. චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්ෂේත්‍ර දීමනාව හිමි ඇතැම් නිලධරයන්ට එම දීමනාව නොගෙවන බවට වන නියෝජනයන් සැලකිල්ලට ගෙන මෙම චක්‍රලේඛ ලිපිය නිකුත් කෙරේ. කිසියම් නිලධරයකු වෙත එම ක්ෂේත්‍ර දීමනා ගෙවීම සම්බන්ධයෙන් ගැටලුවක් පවතී නම් අදාළ ආයතන ප්‍රධානියා විසින් එය ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා ගත යුතුය.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
අධිකරණ අමාත්‍යාංශය